

# Pink

අම්මටයි - දුවටයි

**2024 අප්‍රේල් 05 වැනි සිකුරාදා**
**පළමු බාණ්ඩය**
**හැට වෙනි කළාපය.**

pink womens magazine

කාන්තා සැමට
නොමිලේ පිදෙන
ළෙන්ගතුම තිළිණය

## Yohani de Silva

**ශ්‍රී ලංකාවේ වැඩිමදෙනා කියවන ඩිජිටල් කාන්තා පුවත්පත**

# බුද්ධිමත් කාන්තාවන්ගේ ඩිජිටල් පුවත්පත

## මේ හැමදේම
## නොමිලේම දෙන්නේ ඇයි ?


ලෝකය කාලෙන් කාලෙට ඉක්මනින් දියුණු වෙමින් පවතිනවා. ඒ දියුණු ලෝකයට
තත්පරයෙන් තත්පරයට විවිධ අලුත් තාක්ෂණික අංග එක් වෙනවා. ඒ සියලු දේ එක්ක අලුත් වීම
අපේ ජීවිතයේත් දෛනික කටයුත්තක් බවට පත්වෙලා.

මේ දියුණු ලෝකේ කාන්තා සැමට එක ලෙස එකට හිඳ රස විඳින්නට හැකි
තිළිණයක් විදියට ඔබේ අතට පත්වෙන මේ ඩිජිටල් පුවත්පත හඳුන්වන්න පුළුවන්.
අපි මේ හැමදේම ඔබට නොමිලේ තිළිණ කරන්නේ
අපේ වටිනාම වස්තුව ඔබ නිසාමයි.

නොමිලේ ඔබට ලැබෙන මේ ඩිජිටල් පුවත්පත බුද්ධිමත්ව භාවිත කරන්න.
තවත් කෙනකුගේ පරිශීලනය වෙනුවෙන් බෙදාහරින්න.
අපි අපේ ලෝකය තව ලස්සන කරමු.

ශමිලා ප්‍රනාන්දු
ප්‍රධාන කතෘ
0760 679 814
0716 861 825




නුවරට
මනුෂ
SMART
වැඩ්ඩන්ටයි මේ රට
මගෙන්
පටන්
ගමු











# අපේ කම විදහා දක්වන, බතික් කලාව

ඉස්සර කාලේ පැරැන්නෝ ඇඳුම් විදිහට යොදා ගත්තේ සතුන්ගේ හම් වගේ දේවල්.ඉතින් කාලයත් එක්ක තාක්ෂණයේ දියුණුවත් සමග නූල් වර්ණ ගන්වලා රෙදි වියන්න පටන් ගත්තාලු.මේ කාලෙදී තමයි බතික් කලාව ලංකාවට එන්නේ.ඊජිප්තුවෙන් ආරම්භ වුනු බතික් නිර්මාණ කලාව අද වෙද්දී ලාංකිකයන්ගේ රැකියාවක් බවට පත් වෙලා තියෙනවා.අද දිරිය කාන්තාව පිටුව වර්ණ ගන්වන්නේ බතික් නිර්මාණ කලාවෙන් ජීවිතය ජය ගත් ඇගේ කතාවයි.

ඇය පුෂ්පකාන්ති.ඇය ජීවත් වෙන්නේ පන්නිපිටියේ.

වෛවර්ණ බතික් නිර්මාණ කලාව තුළින් ජීවිතය දිනන්න උත්සාහ දරන ඇය සාර්ථක ව්‍යවසායිකාවක්.ජාතික ශිල්ප සභාව හා එක්වී බතික් නිර්මාණ කලාව ඉගෙන ගෙන අද විලාසිතා ලෝකයක් මවන්න ඇය වෙර දරනවා.

අද බතික් නිර්මාණ කලාව ගොඩාක් කරන්නේ කාන්තාවන්. ඉතින් ගෙදර ඉඳන් කරන්න පුලුවන් හොඳ රැකියාවක් මේක. බතික් නිර්මාණ ගැන මම ළමයින්ට උගන්නවා.දැන් එයාලා ගොඩාක් අය බිස්නස් කරනවා.



බතික් නිර්මාණ කලාව අද වෙද්දී ලෝකය පුරාම ප්‍රචලිත වෙලා තියනවා.සාම්ප්‍රදායික චිත්‍ර කලාව මුසු වෙමින් කරපු මේ නිර්මාණ අපේකම විදහා දක්වනවා.

අපිට තියන ලොකුම ගැටලුව තමයි අමුද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නය.මේකෙදී ඉටි වර්ග,ඩයි වර්ග,රෙදි වර්ගවල මිල ඉහළ ගිහින් තියනවා.ඉතින් අද මිල තීරණය වෙන්නේ ඒවත් එක්ක.රජයෙන් අමුද්‍රව්‍ය වලට සහනයක් දෙනවානම් අපිට ඩොලර් ගේන්න පුලුවන්.

ජීවිතය කියන්නේ උත්සාහයෙන්, කැපවීමෙන් ජය ගන්න ඕනෙ දෙයක්. ඇගේ නිර්මාණ හැකියාව ලෝකය දිනන්න අපූරු තෝතැන්නක් වෙනවා.





මම බතික් නිර්මාණ කලාව පටන් අරන් දැන් අවුරුදු 20 කට වඩා වැඩි. ජාතික ශිල්ප සභාව මට ගොඩාක් උදව් කළා. කාටහරි බතික් කලව ඉගෙන ගන්න ඕනේ නම් මම කියන්නේ ජාතික ශිල්ප සභාව මගින් පුහුණු ගුරුවරයෙක් හරහා ඉගෙන ගන්න කියලා.

බතික් නිර්මාණ කලාව අපිට තනියෙන් කරන්න ටිකක් අපහසුයි. මොකද නිර්මාණයක අවසන් ඵලය සාර්ථක වෙන්නේ කැපවීම මත. ඉතින් ඇයට පවුලෙන් ලැබෙන සහයෝගය ගැනද මතක් කළේ මෙලෙසින්.

මට මුලින්ම සහයෝගය දුන්නේ මගේ ස්වාමියා.ඊට පස්සේ මගේ දරුවන් තුන්දෙනා මට ගොඩාක් සහය දෙනවා. මම ඇඳුමක් නිර්මාණය කරන්න ගියහම එකේ අඩුපාඩු, දැන් තියන විලාසිතා ගැන ඒම කියන්නේ මගේ දරුවෝ. ඉතින් එයාලා මට ගොඩාක් සහය දෙනවා.

ඇගේ කතාව මට කියන කොට තේරුනේ ඇය හොඳ අම්මා කෙනෙක් කියලා. මොකද





දරුවන් එක්ක එකතු වෙලා කරන මේ බතික් නිර්මාණ කලාවට හැමවෙලේම ඔවුන් නව අරුතක් දෙන්න උත්සාහ කරනවා.

ඇත්තටම මේක ලේසියෙන් කරන්න පුලුවන් දෙයක් නෙමේ. කුස්සියේ වැඩ මීට වඩා ලේසි කියලා මට හිතෙනවා.කොච්චර දුක් විදලා මේක කළත් අවසන් නිර්මාණ දකිද්දී පුදුමාකාර සතුටක් දැනෙන්නේ.ඒක මම කරන නිර්මාණ එක්ක තමයි තීරණය වෙන්නේ.

ඉතින් අවසාන වශයෙන් ඇය අපේ චසබන පාඨකයන්ට ද පණිවිඩයක් එක් කරන්න අමතක කළේ නෑ.

මම ව්‍යාපාරයක් කරන හින්දා මට හැකියාවක් තිබුනා වියදම් කරන්න. ඉතින් ඒක මට ලොකු හයියක්. මහත්තයා මුදල් දෙනකන් බලන් ඉන්න ඕනේ නෑ.ඒ හින්දා මම කියන්නේ කාන්තාවන්ට මේ වගේ බතික් නිර්මාණ ව්‍යාපාරයක් පටන් අරන් දරුවොත් බලන් ගෙදරට වෙලා ඉන්න පුලුවන් කියලා. ඉතින් ජාතික ශිල්ප සභාවත් එක්ක එකතු වෙලා ජීවිතය සාර්ථක කරගන්න කියලා අවසන් වශයෙන් මම ප්‍රාර්ථනා කරනවා.


ශක්තිමත් මවක්,කාන්තාවක්, ව්‍යවසායිකාවක් විදිහට ඇගේ උත්සාහය අගය කළ යුතුමය.පුෂ්පකාන්ති වැනි කාන්තාවන් අනාගතයේ තව කාන්තාවන් බිහි වෙන්න යැයි අපි ප්‍රාර්ථනා කරන්නේ දේශීයත්වය රැකගෙන ඉදිරියට යන්න ඇයවන් කාන්තාවන් මහ මෙරක් නිසාය.



**ප්‍රාර්ථනා කොඩිකාර**



# පොදු ප්‍රවාහන සේවාවන් වල ගමන් කරන ඔබ මේ නිතී රීති ගැන දැනුවත්ද?



## මම සෙරෙප්පුව අතට ගන්නද? නැත්නම් ඊළඟ හෝල්ට් එකෙන් බැහැල යනවාද?"

ඔක්තෝබර් 11 ලෝක ගැහැණු ළමුන්ගේ දිනය ලෙස යෙදී තිබුණි. නමුත් දිනෙන් දින කාන්තාවන් සහ පාසල් දැරියන් පිලිබඳව අමිහිරි පුවත් අසන්නට ලැබේ. එනම් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වන කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසනය සිදු වන ප්‍රධාන සමාජ ස්ථානයක් ලෙස පොදු ප්‍රවාහන බස් රථ හා දුම්රිය වී ඇත.

ශ්‍රී ලංකාවේ බස්රථ හා දුම්රිය වැනි පොදු ප්‍රවාහන සේවා භාවිත කරන කාන්තාවන්ගෙන් 90%ක් එම ප්‍රවාහන මාධ්‍ය ඇසුරේදී ලිංගික හිංසනයට ලක්වන බව එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල විසින් 2017 වසරේ නිකුත් කරන ලද වාර්තාවක සඳහන් වේ. මේ අතරින් වඩාත් පීඩාවට පත්ව ඇත්තේ රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා පොදු ප්‍රවාහන සේවය භාවිත කරන කාන්තාවන්ය. නමුත් ඒ සම්බන්ධයෙන් පොලිස් රැකවරණය පතන්නේ අදාළ කාන්තාවන් අතුරෙන් 4%ක පමණ පිරිසක් බව පොලිස් ළමා සහ කාන්තා කාර්යාංශයේ දත්ත අනුව පෙනී යයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) වගන්තිය අනුව "කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වු හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය" යනුවෙන් සඳහන් වන අතර වසර 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනතේ 345 කොටස අනුව ද ලිංගික හිංසනය යනු දඬුවම් ලැබිය හැකි සාපරාධී වරදකි. මෙම කොටස අනුව ලිංගික හිංසනය යටතට ලිංගික ස්පරූශී පහරදීම්, සාපරාධී බලය යෙදවීම, හිංසනයට ලක්වන පුද්ගලයා කුපිත කිරීමට හේතුවන වචන හෝ ක්‍රියා අයත් වන බවද සඳහන් වේ. එහෙත් එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් කරනු ලැබූ සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 52%ක් ලිංගික හිංසනය අපරාධයක් ලෙස සැලකෙන නීතියක් තිබෙන බව දැනසිට ඇති නමුත් 60%ක් දෙනා ලිංගික හිංසන වරදට දඬුවමක් තිබෙන බව දැනසිට නැත.

මෙම වරදට එරෙහිවීම සඳහා ඔබ අයිතියක් ඇත. එවන් අවස්ථාවකදී පොලිස් ක්ෂණික දුරකථන අංක 119, කාන්තා උපකාරක දුරකථන අංක 1938 හෝ ජාතික ගමනාගමන මණ්ඩලයේ ක්ෂණික දුරකථන අංක 1955වෙත දැනුම් දිය හැකිය. බස් රථයක් තුළ මෙවැනි හිංසනයක් සිදුවෙන බව දැනුණොත් එය තමන්ට නොවුනත් වෙන කෙනෙකුට සිදුවුවත් ඇයට කතා කිරීමට සහයෝගයක් වෙන්න අමතක කරන්න නොකරන්න. එසේ නොමැති නම් එය ඔවුන්ගේ අධ්‍යාපනයට, රැකියාවන්ට හා පෞද්ගලික ජීවිතවලට අහිතකර වේ. එහි ප්‍රතිඵලය මුළු රටට ම බලපායි. නිදසුනක් ලෙස, කාන්තාවන් ශ්‍රම බලකාය සමග සම්බන්ධ වීමට එය බාධාවකි. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් ශ්‍රම බලකාය සමග සම්බන්ධ වන්නේ 34%ක් පමණි. සුරක්ෂිත පොදු ප්‍රවාහනය කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට අතිශය වැදගත් ය. ලිංගික හිංසනයන්ට බිය නොවී පොදු ප්‍රවාහන සේවා පාවිච්චි කිරීමේ නිදහස ඔවුන්ට තිබිය යුතු ය.




**නිරෝෂා සඳමාලී**

**ජනසන්නිවේදනය අධ්‍යන අංශය කැළණිය විශ්වවිද්‍යාලය**






"අනේ අපෙනුත් මල් ගන්නකෝ". මේ වාක්‍යය ඔබ බොහෝ දුරට අහලා ඇති. රුහුණු මහා කතරගම දේවාලයට නිතර ඔබ යන කෙනෙක් නම්, මේ කියමන ඔබට හරි හුරුපුරුදු එකක් වෙනවා නොඅනුමානයි. කතරගම දේවාලයට ඇතුළු වන දොරටුව දෙපසින් ඕලු, නෙළුම්, මානෙල් වැනි බුදුන්ට පූජා කරන මල් වර්ග අතැතිව ඒවා විකුණන මල් වගේ තරුණියන් ඔබ දැක ඇති. ඔබත් එක් වරක් හෝ කතරගම දේවාලයට ගිය බැතිමතෙක් නම්, මේ කියන්නාවූ තරුණියන්ගෙන් මල් ගැනීමට ඔබ, මම කවුරුත් නොපැකිලිව පෙළඹෙයි. නමුත් ඔවුන් ඒ විකුණන මල් මෙන් සුවඳවත් බවක්, වර්ණවත් බවක් සමහර ඒ මල් විකුණන තරුණියන්ගේ ජීවිත තුළ නැති බව ඔබ දැනගෙන සිටියාද? අද අපි කතා කරන්නේ ඕලු, නෙළුම් මල්වල පාට මෙන් තමාගේ ජීවිතයට පාට එකතු කරගෙන එය වර්ණවත් කර ගැනීමට වෙර දරන 'මල් කෙල්ලෙක්' පිළිබඳවයි.

ඇය නයනි වෙයි. කතරගම දේවාලයට නුදුරින් ඇයගේ නිවස පිහිටා ඇති බවක් ඇය මා හට පැවසුවා. රූප සම්පත්තිය අතින් නයනි ඉතා පියකරු වුවත්, නයනිගේ ජීවිත කතාව නම් එතරම් පියකරු එකක් නොවෙයි.

නයනි උසස් පෙළ දක්වා ඉගෙන ගත් තරුණියක්. ඇයට විශ්වවිද්‍යාලයට යන්නට වරම් ලැබුණත්, තම පවුල තුළ පවතින්නා වූ දැඩි ආර්ථික අර්බුදකම් හේතුවෙන් ඇය තමන්ගේ පවුල වෙනුවෙන් තමන්ගේ හීනය වූ සරසවි යාම කැප කළාය. ඒ ගැන ඇය මා හා පැවසුවේ මෙයාකාරයටයි.

" මම මිස් ඒ ලෙවල් වෙනකන් ඉගෙන ගත්තා. කැම්පස් එහෙමත් සිලෙක්ට් උනා. ඒත් මිස් මට යන්න බැරි වුණා.අපේ ගෙදර තියෙන ප්‍රශ්නත් එක්ක. මගේ අම්මා පිළිකා රෝගියෙක්. මට නංගිලා දෙන්නෙක් ඉන්නවා. ඒ දෙන්නා තාම ඉගෙන ගන්නවා. තාත්තා කරන්නේ කුලී වැඩ. තාත්තා වැඩ කරලා හම්බවෙන සොච්චමෙන් කරන්නේ බීලා නාස්ති කරන එක විතරයි. ඉතින් තාත්තත් ඉතුරු කරන්නෙ නැති නිසා, නංගිලා දෙන්නට උගන්නන්න ඕන නිසා මම මේ විදිහට මගේ හීනෙත් කැප කරලා මල් විකුනන්න පටන් ගත්තා.

ඇයට යන්තම් වයස විස්සක් පිරී හමාරයි. ඇය තවමත් යෞවනේ හිරිමල් වියේ පසුවන යුවතියක්. ඒ වයසට ඇය මෙතරම් වගකීමක් දරන එක පිළිබඳව මම මහත් පුදුමයට පත්වුණා. ඇය ගැන ඊළඟට ඇය කතා කළේ මේ විදියටයි.

"අපේ අම්මා තමයි මේ කඩේ ඉස්සර මල් විකුනුවේ. පස්සේ අම්මට අසනීප වෙන්න ගත්තම මම තමයි කඩේ කලේ. අම්මා අසනීප උනේ මම ඒලෙවල් ලියද්දි, ඉතින් මම අම්මාවත් බලාගෙන, කඩෙත් කරගෙන, ඒ අතරේ පාඩම් වැඩත් කරලා තමයි විභාගෙ ඒ විදිහට පාස් වුණේ."

ඇය සැබැවින්ම දක්ෂ තරුණියක්. ජීවිතයට එන අභියෝග හරි අපූරු ආකාරයට භාරගන්නා තරුණියක්. ඇය තම රැකියාව කරන ආකාරයත්. ඇගේ දෛනික වැඩපිළිවෙළත් මා වෙත මෙලෙසින් කීමට උත්සාහ කළා.

" මම මිස් පාන්දරම වැවට යනවා මල් කඩන් එන්න. මට ඒ වැව පුරුදුයි. ඒ අපේ ගමේ වැවමයි. පස්සේ මල් කඩාගෙන ඇවිත් ඒ ටික අඩුක් කරගන්නවා.

# වැටි වැටී නැගිටින කතරගම මල් කෙල්ල



PiNK

ඊට පස්සේ මම ගෙදර අයට කන්න හදන්න උයනවා. අම්මට නම් ලොකුවට කෑම කන්න අමාරුයි. ඒත් මං අම්මාටයි, තාත්තටයි, නංගිලා දෙන්නටයි උදේටයි, දවල්ටයි දෙකටම එකපාර උදේ කෑම හදනවා. ඊට පස්සේ අම්මාට කෑම කවලා මම ගෙදරින් පිටත් වෙනවා. දවල් නංගිලා එනකං අම්මා  ගෙදර ඉන්නේ තනියම. අම්මා ලෙඩ ඇඳේ ඉන්න නිසා මට කඩේට එක්කන් එන්නත් අමාරුයි මිස්. මම හයට විතර ගෙදර එනවා. ඒ එන්නෙත් ගෙදර අයට ආපහු රෑට කෑම හදලා දෙන්න ඕන නිසා. මම එනකම් මගේ කඩේ වැඩ ටික මගේ හිතවත් තවත් මල් කඩයක් කරන අක්කා කෙනෙක් බලා ගන්නවා. ඊට පස්සේ මම රෑට කෑම උයලා අම්මා ළඟ ටිකක් වෙලා ඉඳලා ආපහු රෑ අටට විතර කතරගම මට යනවා. ඊට පස්සේ රෑ එකොළහ විතර වෙනකන් ඉඳලා තමයි ගෙදර එන්නේ..."

ඇගේ ජීවිතයේ ඇය මුහුණ දී ඇති ප්‍රශ්න හමුවේ අපි මුහුණ දී තියෙන්නේ ඇත්තටම ප්‍රශ්න වලටද කියලත් මට හිතුනා. ඒ තරමටම ඇගේ ජීවිතේ හොඳම කාලෙ ඇයට අමාරු ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීමට සිදුවූ නිසාවෙන්.

ඇය මේ මල්  කඩය කරගෙන යද්දී ඇයට සිදුවූ යම් යම් අකරතැබ්බයන් ගැනත් ඇය මා සමග මෙයාකාරයට පැවසුවා.

"එක දවසක් මිස් මම වෙනදා වගේම වැවේ මල් කඩන්න ගියා. ඒ වැවේ කිඹුල්ලු හිටියත් මං කවදාවත් දැකලා තිබ්බේ නැහැ. නමුත් එදා මං දැක්කා කිඹුල්ලු දෙන්නෙක් මගේ ඔරුව දිහාට පීනගෙන එනවා කියලා. මට කර කියාගන්න දෙයක් නැතිවුණා. බැරිම තැන මං උදව් ඉල්ලලා කෑ ගැහුවා. ඊට පස්සේ තමයි අපේ ගමේ එදා වැව ළඟ හිටපු අයියලා කට්ටියක් ඇවිත් මාව බේරගත්තේ. එදා තමයි මට මගේ ජීවිතේ මරණ බය දැනුනේ...."

තමන්ගේ ජීවිතයත් පරදුවට තබාගෙන තමන්ගේ මව වෙනුවෙන්, නැගණියන් වෙනුවෙන්, පියා වෙනුවෙන්, පවුල වෙනුවෙන් කටයුතු කරන ආකාරය ගැන ඇය ඇගේ වචනවලින් කියද්දී ජීවිතයේ ගැඹුර පිළිබඳව සංවාදයකට මම මගේ සිත තුළින්ම ගිය බවක් මට දැනුනා. 'සුදු නෙළුමකෝ සොර බොර වැවේ' රත්න ශ්‍රී විසින් එදා ලියූ ඒ ගීය මට ඇය ඒ කතාව කියද්දී මතක් උනා.

'ඇත්තටම ඔයාට ජීවත්වීමට කඩේ ආදායම ඇතිවෙනවාද?" මගේ ඊළඟ ප්‍රශ්නය වුණේ එයයි.

"කොහොමත් මිස් පෝයට වගේ නම් බිස්නස් වැඩියි. අනෙක් දවස්වලට බිස්නස් තිබ්බත් ගොඩක් නෑ. අපිට යන්තම් කාලා  වේල පිරිමහගන්න තිබුණත්, අම්මාගේ පිළිකා රෝගයට දෙන බේත් ගන්න, නංගිලාගේ අධ්‍යාපනයට යන වියදම් එක්ක බැලුවම නම් ඇත්තටම ආදායම මදි. ඒත් මොනවා කරන්නද? මේක අපේ දෛවය කියලා හිත හදාගෙන ඉන්නවා...."

අපේ කතාබහ අතරත් ඇගේ අතේ නෙළුම් මලක් තියාගෙන ඇය කතාව කිව්වා. ජීවිතයේ ඇය මුහුණ දුන් සමහර කටුක අත්දැකීම් පිළිබඳව ඇය කියද්දී, ඇගේ අතේ තිබෙන නෙළුම් මලේ පෙති ඇය අතින් කැඩෙන්නේ ඇයටත් නොදැනීමයි. ඒ තරමටම ඇගේ ඒ කතා ඇයගේ මේ පුංචි වයසට ඉහිලීමට නොහැකි නිසාවෙන්.

ඇය ඇගේ පියා පිළිබඳව තොරතුරු කීමට මට අකමැති වූවායෙන් මම නැවත නැවත ඇගෙ න් ඒ පිළිබඳව විමසීමකට ලක් නොකිරීමට වගබලා ගත්තා.

අපේ කතා බහ අවසානයේ ඇයගෙන් මම ඇහුවේ ඇගේ අනාගත හීනය කුමක්ද යන්න කියයි. එවිට ඇය කිව්වේ "පළවෙනිම දේ තමයි අම්මාව සනීප කරගන්න එක. ඒ වගේම නංගිලාට හොඳට උගන්නලා හොඳ තැනකට ගේන එක තමයි මිස්..."

'අක්කා කියන්නෙත් අම්මෙක් තමයි ලොවේ...ලේ කිරි වෙන්න පින් මදිවුණු සසර මගේ...' සැබවින්ම ඇය අක්කාගේ භූමිකාවත්,දියණියකගේ භූමිකාවත් දයානුකම්පිතව ඊට වටිනාකමක් ලබා දෙමින් ඉටු කරන අන්දම පිළිබඳව ඇය කියූ දේවල් වලින් මට සත් සුදක් සේ පැහැදිලියි.

මට ඇයව හමුවූයේ කතරගම දේවාලයට යන අතරමඟදී අහම්බෙන්. අහම්බෙන් ඒ ආකාරයට මට හමුවූ නයනි මේ කතාව අවසානයේ මගේ හොඳම මිතුරියක තරමටම මා සමග කුලුපග වුණා. ඒ මිත්‍රත්වය කොපමණක්ද කියනවා නම්, කතාව අවසන් කර මම දේවාලයට යන්න ඇයගෙන් මල් මිලදී ගැනීමට යද්දී ඇය මගෙන් කිසිදු මුදලක් අය නොකර ඇගේ පිවිතුරු හිතින්ම මට සුදු නෙළුම් මල් පොකුරක් ලබා දුන්නා.

ඒ මල් පොකුර පූජා කරමින් කතරගම දෙවියන්ගෙන් මම ඉල්ලුවේ නයනිගේ සියලු සැදැහැවත් බලාපොරොත්තු සුපැහැදිලිව ඉටු වේවා යන්නයි. හරියට සුදු නෙළුම් මලක් වගේ.

නයනි, ඔබ වත්මන් තරුණියන් සියලු දෙනාටම ආඩම්බරයක්. ඔබේ අනාගතය බැබලේවා!

මෙහි එන නම් ගම් සියල්ල මනඃකල්පිත වෙයි.

**සටහන - ඉසුරි එදිරිසිංහ**
**කැලණිය විශ්වවිද්‍යාලය**


SNTRAVEL
Bringing the world closer to you
Direct opportunity for all beauty care professionals !
Join a 02-Day workshop on Microblading, Microneedling, BB Glow Treatment & Eyelash Extensions In
Bangkok
Thailand
20th - 23rd May 2024
Group Tour
03N/04D Package Includes :
• 4* hotel accommodation
• Daily breakfast
• Early check in
• Return air ticket
• Thai Visa
• 02 Day Workshop on microblading & microneedling with certificate
• Transfer for beauty care institute for workshop
• Airport transfers
• Dinner cruise & Asiatique night bazaar tour
RS. 275,900/-
PER PERSON | TWIN SHARING
Contact us for bookings & info :
+94760942234, +94726755155
info@sntravelth.com
www.sntravelth.com



# BE SMART

කෙටි කතා මාලාව......

කාර්යාලය නිමවී බස් නැවතුම එමින් සිටි සඳරේඛා සිටියේ කෝපයෙන් දැවෙමිනි.
තමා දැන් මේ ආයතනයට සේවයට පැමිණ වසර දහයකට ආසන්නය. සඳරේඛාට තරම් ආයතනය පිළිබඳ දැනුමක් අවබෝධයක් ඇති කිසිවෙකු මෙහි නොමැති බව නොරහසකි.

නමුත් කාර්යාලය තුළ තමන්ට ඇති ගෞරවය, සේවකයන් තුළ තමාට ගැන වූ බිය මුසු හැඟීම ඔවුන්ගේ සිත් තුළින් පහව යන්නට වූයේ, අලුතෙන් වැඩ භාරගත් අමන්දාගේ ආගමනයත් සමගය.

කල්පනා ලොවක තනිවෙමින් බස් නැවතුමතෙක් පැමිණි සඳරේඛාට තමා සමග ආ නිලූකා සිහි වූයේ, ඈ තම අතින් අල්ලා ගත් විටය.
" මොකද සඳා අදත් මූඩ් ගහලා. ඔහොම තරහෙන් ඉන්න එපා අනේ, ඔයා අසනීප වෙයි. මේ දවස් ටිකේම මම බලාගෙන හිටියේ.
ඔයා ඉන්න පුදුම කේන්තියකින්.
අද ඔෆිස් එකේදි කී දෙනෙකුගේ ඇඟට කඩන් පැන්නද? "

"අනේ මං දන්නෑ නිලූ. මම දැන් මෙතන වැඩ කරන්න අරන් කොච්චර කල්ද?
මම මොන දේ කළත් ලොකු වුණේ අර අලුතෙන් ආපු අමන්දාව. ඔවු, මං වැඩ කරන අයට කෑගැහුවා තමයි. ඒත් මං එහෙම කලේ මේ සතියෙ ටාගට් වැඩිපුර කවර් කරගන්න ඕන නිසා.
මං මෙහෙ මැරිල මැරිල වැඩ ඉනර වෙනකොට හතත් පහු වෙනවා.
අරෙහෙ අමන්දා..
හැඩ වැඩට ඇඳල ඇවිත් හොඳට හිනා වෙලා කතා කරල පහ වෙනකොට යන්න යනවා".

" එහෙම නෙමෙයි සඳා...
අමන්දා ඔෆිස් එකේ වැඩටික නීට් එකට කරනවානෙ. අනික සේකවකයන්ට උනත් කෑගහන්නෙ නෑනෙ සඳා. ඒ නිසා වැඩ කරන මිනිස්සු උනත් අමන්දාගෙ එක කමාන්ඩ් එකකට ලේසියෙන්ම අවනත වෙනවා"..
නිලූකා කීවාය..

මං දන්නෑ නිලූ. එහෙන් අර කොල්ලො ටික මට හිනා වෙනව පිස්සෙක් වගේ ලු. හැට පැනපු ආච්චියෙක් වගේලු. මගේ හිතට වගේම ඇඟටත් හරි වෙහෙසයි..

"කිච්චට තරහ වෙන්න එපා සඳා. ඔයාගෙත් ගොඩක් දේවල් වෙනස් වෙන්න ඕනි.
මං කියන්නද අද අපි මගේ ඇනෙක්ස් එකට යමු. හෙට උදේම ඔයාලගේ ඇනෙක්ස් එකට යමු."
යෝජනාව නිලූකාගෙනි.

මිතුරියන් දෙදෙනා නිලූකාගෙ නවාතැනට පැමිණියහ. මිදුලට අඩිය තබද්දි සඳරේඛා ට අමුත් හැඟීමක් දැනුනේ මිදුලේ වූ අලංකාර මල් දැකීමෙනි.





නිලූකා විවර කල දොරෙන් ඇතුලට ආ සඳරේඛා ගේ දෙනෙතට හසුවුනේ මනා පිළිවෙලට සැකසූ නිලූකාගේ ඇනෙක්සියයි. කුඩා විසිත්ත කාමරයෙහි වූයේ රූපවාහිනියක්, පුටු සැටියක් සහ මනරම් මල් බඳුනකි.

එහි වූ පිළිවෙල දැක සඳරේඛාගේ මනස තරමක් සැහැල්ලු විය.

ඇයට පසුපසින් පැමිණි නිලූකා,

" ඉතින් කොහොමද මගේ කුලි මාලිගාව" යි ඇසුවේ සතුටිනි.

" ඇත්තටම මාලිගාවක් වගේ බං"

ඒ වචන සඳරේකාගේ මුලින් පිටවූයේ අෑ නොදැනුවත්වමය.

"එන්නකෝ සඳා මගේ මාලිගාව පෙන්නන්න" යයි ඉතා ලෙන්ගතුව කියූ නිලූකා,

තම අතින් අල්ලා නිවසේ වූ එකම නිඳන කාමරය වෙත යද්දී,

දෙනෙත් පුදුමයෙන් මහත් විය එහි වූයේ මනා පිළිවෙල දැකීමෙනි.

ඉතා සුඛෝපභෝගී භාණ්ඩ නොතිබුණත්, නිලූකා, තමා පාවිච්චි කරන සියලුම දේ ඉතා පිරිසිදුව පිළිවෙලට තබාගෙන සිටින අයුරු දුටු සඳරේඛාගේ මනසට විදුලිසැරක් මෙන් ආවේ, තමාගේ අපිරිසිදු ඇනෙක්සිය ය.

නිලූකාගේ ඇනෙක්සියට වඩා පහසුකම් වලින් හෙබි නමුත්,තමාගෙ නවාතැන මිහිපිට අපායක් මෙන් යැයි සඳරේඛා ය සිතිණි.

නිලූකාගේ පුංචි කොරිඩෝවේ වූයේ අෑ පාවිච්චි කරන පාවහන් ඉතා පිළිවෙලට අසුරන ලද ෂූ රැක් එකය.

නිලූකාගේ කාමරයෙන් දැනෙන පිච්චමල් සුවඳට ඉව කරමින් සිටි සඳරේඛාට සිහි වූයේ, ඇගේ නිඳ කාමරයෙන් වහනය වන පුස්ගඳ සහ දහඩිය ගඳය. සේදූ රෙදි හා නොසේදූ රෙදි එක මත එක ඇති රෙදි පුටුවය.

මේ සියල්ල දෙස සංසන්දනාත්මක මනසින් කල්පනා කරමින් සිටී සඳරේඛාට කොහේ හෝ තැනක තමන්ට වැරදී ඇති බව සිතෙන්නට විය.

"මේ බලන්නකො සඳහා මං අලුතෙන් ගත්ත ස්කින්කෙයා ප්‍රඩක්ට් ටික"

යනුවෙන් පැවසූ නිලූකා තමා පාවිච්චි කරන දේවල් පෙන්නුවාය. එහිවූ සරල මේකප් බඩු දුටු සඳරේඛාට හීල්ලිණි.

" අනේ මමත් ආසයි නිලූ. කොහෙද ඉතිං මේ තිහත් පැනපු මට මොන මේකප්ද? අනික මේ වැඩ එක්ක කෝ මේවට වෙලාවක්"

"අයියෝ මේවට එච්චර වෙලාවක් යන්නෙ නෑ අනේ.මෙතන මහ ලොකු දේවල් නැහැනේ. ලිප්ස්ටික් එකක්,පවුඩර් එකක් තව පොඩි පොඩි දේවල් ටිකක් විතරයි තියෙන්නේ. මං ගාව තව තියෙනවා. මේ ටික අලුත් මේවා ඔයා ගන්න. මේකෙන් ලස්සන මේකප් එකක් දාගෙන එන්න අනිත් දවසෙ."

"නිලූ අමන්දත් මේකප් දාල ලස්සනට එනවනෙ.බලන්නකෝ එයාගේ ලස්සන. එයා ඇත්තටම හරි ලස්සනයි නේද? එයා මේකප් දැම්මත් දැම්මේ නෑ වගේ නේද? ඒ ළමයා හරි ලස්සනට අඳිනවා. මට දැක්කහම ඇත්තටම එයා ගැන ගොඩක් ඉරිසියයි.

ඒ මදිවට එයා ගාවින් එන සුවඳ ඇත්තටම මම මම එයත් එක්ක මාව ගොඩක් සන්සන්දනය කළා. ඒකෙන් උනේ මගේ හදවත තුවාල වුණ එක විතරයි.

මම කවදාවත් උත්සාහ කළේ නෑ මේ වගේ අලුත් දෙයක් අත්හදා බලන්න.

එන්නකෝ සඳා. අපි මොනවහරි බොන ගමන් කතා කරමු"

නිලූකා ඇයව කැඳවාගෙන ගියේ පිලිවෙලය අස් කරන ලද මුලුතැන් ගෙය වෙතටය..

නිලූකාගේ මුළුතැන් ගෙයි පිළිවෙල දුටු සඳරේඛාට නැවත වතාවක් තමා ගැනම පසුතැවීමක් දැනුනි. තමාගේ මුළුතෙන් ගෙයි ඇති ඉඳුල් ගඳ පෙළුනු ගඳ ඇයට ඇගේ නහයට දැනුත් දැනෙනවාක් මෙන් විය.

ඇය නිලූකා අත අල්ලා ගත්තේ දුකෙනි.

" මට දැන් තේරෙනවා,මට වැරදුන තැන. නිලූකා ඔයාලා ජොබ් එක කලත් තමන්ගේ ජීවිතය ලස්සනට ගෙවනවා.

ඒත් මම හිතුවේ රැකියාව කරන එක විතරයි මුළු ජීවිතේම කියලා.

ඉතින් අවුරුදු දහයකට කිට්ටු කාලයක් මගේ ජීවිතේ ගත වුණේ මේ ඔෆිස් එකට.

කොටින්ම කිව්වොත් මට මගේ සුදුසුකම් වලට හරි යන වැඩි පඩියකට වෙන රස්සාවකට යන්නවත් හිතුනෙ නෑ.

මොකද මම ඉගෙන ගන්න මම හිතුවේ මම ඉගෙන ගත්ත දේවල් වලට වටිනාකම දෙන්න ඕනේ හොඳට ඉගෙනගෙන රස්සාවක් කරල හම්බ කරලා කියලා විතරමයි.

ඒ නැතුව මට හිතුනෙ නෑ කවදාවත් මම මං වෙනුවෙන් ජීවත් වෙන්න ඕනේ, මේ ජීවිතේ තියෙන්නේ විඳින්න කියලා මම හිතුවේ නෑ...



මම හිතුවේ ජීවිතේ තියෙන්නේ වැඩ කරන්න හම්බ කරන්නම විතරයි කියලා. අන්න එතනයි නිලූ මට වැරදුනේ. ඒ නිසයි මම අමන්දට උනත් ඉරිසියා කරන්න ගත්තේ. ඒ නිසයි මම ඔෆිස් එකෙක් අයට උනත් කෑගහන්න බනින්න තියාගත්තේ. ඇත්තටම මට ඕන දැං වෙනස් වෙන්න"..

සඳරේඛාකියාගෙන යද්දී නිලූකාගෙ මුහුණෙහි වූයේ සැනසුම් සිනහවකි..

"හරි සඳරේඛා. ඉස්සෙල්ලම අපි කරන්න ඔන , ඔයාගේ ඔය ඕනවට වැඩි වැඩ ටිකෙන් නිදහස් වෙලා ඉන්නඑක. ඔයා නෙදන්නව උනාට ඔයා කරන්නෙ අනුන්ගෙ වැඩත් එක්ක.

ඔයාගේ පොසිෂන් එකට ඔයාට ඇසිස්ටන්ට් කෙනෙක් ඕන නේද? කියලා ආපු ඉල්ලීමත් ඔයා ප්‍රතික්ෂේප කළානෙ. ඔයා අදම මේල් එකක් දාන්න ඔයාට උදව්වට කෙනෙක් ගන්න ඕනේ කියලා." නිලූකා තම මිතුරියව සැනසුවාය.

ඉන් පසු ගෙවුන සති දෙකෙන් පසු කාර්යාලයට ආවේ අලුත්ම සඳරේඛා කෙනෙකි.

ඇයට මෙච්චර කාලයක් තිබුණු වැඩ අඩු වී තිබුණේ ආයතනයෙන් ඇයට ලැබිය යුතු ඇසිස්ටන්වත් ලැබී තිබු නිසාය.

සඳරේඛාට තිබුණ වැඩ අඩුවීමත් සමඟම ඈ තුළ වූ කෝපය, විඩාව ස්ට්‍රෙස් එක නැතිවීම නිසා ඇය හිටියේ වෙනදට වැඩිය සතුටිනි.

ඉස්සර වගේ ඔෆිස් එක වෙනුවෙන්ම කැප නොවුනත් තමන්ට අදාළ රාජකාරිය අඩු නැතිව පිළිවෙලට කරපු සඳරේඛා තමන් වෙනුවෙනුත් වෙලාවක් වෙන් කරගත්තාය.

එහි ප්‍රතිඵලයක් ලෙස සඳරේඛා තමා වෙත වැඩි අවධානයක් යොමු කිරීමත් සමඟ,ඇය වෙතින් පලා යමින් තිබූ ඇගේ සුන්දරත්වය සහ යෞවනත්වය නැවත වතාවක් ඇය වෙත ළඟාවෙමින් තිබුණි.

සත්කාර කිහිපයකට පසුව ඇගේ වියළි වියලිව පලුදුව තිබු වූ කෙස් කළඹ ඉතා සුසිනිදු මොණර පිලක් බවට පත්වී තිබිණි.

එමෙන්ම රැළි වැටී ගිය මුහුණ ද සමඟ ටිකෙන් ටික යථා තත්ත්වයට පත් වී තිබුණේ ඇය තමන් වෙනුවෙන් කැපකල කාලයට සහ කරගත්තා වූ සත්කාර වලට පින් සිදුවන්නටය.

තමාට ගැලපෙන ආකාරය විලාසිතාවලින් සැරසී කාර්යාලයට එන සඳරේකා සැමටම නුපුරුදු දසුනක් වූ නමුත් කාලයත් සමඟ කාර්යාලයේ සියල්ලෝම සඳරේකාගේ සඳක් මෙන් දිදුලීම ගැන ප්‍රශංසා මුඛයෙන් කතා කළහ.ඇය තවදුරටත් කලින් සිටි "බටකොල ආච්චිය" නොවන වග කලින් කොනෙන් ආරංචි වීමත් සමඟ යෙහෙළියන් දෙදෙනා සිනාසුනේ ඉතා ප්‍රීතියනි. ඇය ළඟින් දැන් වහනය වන්නේ පිච්චමල් සුවඳකි.

සඳරේඛා තවදුරටත් අමන්දාට හෝ අලුතෙන් පැමිණෙන්නා වූ යුවතියන්ට හෝ ඉරිසියා කරන්නට ගියේ නැත.ඇගේ මනස දැන් ඇයටම ආදරය කරන්නට පටන්ගෙන තිබේ.

මාස කිහිපයක් ගතවන විට සදරේඛාගේ ජීවිතය එළිය කරන අලුත් ඉරක්, ඇය වෙනුවෙන් ඇගේ ලෝකයට ප්‍රේමාරාධනාවක් ගැන පැමිණියේ ඇගේ මේ නව වෙනසත් සමඟය.

"ඕකනෙ කියන්නෙ සඳා. අපි අපිටම ආදරේ කරනකොට, අපි සිතුවිලි වෙනස් වෙනකොට හරි ලස්සන දේවල් ජීවිතේ සිද්ධ වෙනවා."

නිලූකා කීවේ ආදරයෙනි..

**මංගලා පවිත්‍රානි**



# හාන්සි වී කිසිමදාක මුදල් හම්බ නොකරන ගෞරවණීය රැකියාවට අපගේ ප්‍රණාමය !!!

අහන් ඉන්න අහගෙන ඉන්න..
ඔවුන්ගේ හිත් මොනවද මුමුණනවා

"ස්... ස්... ස්... සයිඩෙ... සයිඩෙ... සයිඩෙ..."

කඩි ගුලක් වගේ ඇවිස්සුණු වීදී අතරින් ඇහෙන ඝෝෂාකාරී හඬ මධ්‍යයේ ඔවුන් අප පසු කරගෙන ගිය නමුත් වීදීවල ගමන් කරන ඇතැම් මිනිසුන්ගෙන් ඔවුන්ට එල්ලවන ඇනුම්, බැනුම්, ගෙරවුම්වලින් නම් අඩුවක් නෑ. .

"කිසිම තෙත් ගතියක් නැති මිනිස්සු. පාරේ ඉන්න මිනිස්සුන්ව යට කරගෙන යන්නේ."
"ඔය කුලීකාරයන්ට කිසිම චාරයක් නෑ. කුඩු කාරයෝනේ."
"හැමදාම අනුන්ගේ බර අදිනවා."
"ඒ වුණාට අරක්කු සිගරට්වලින් නම් යහමට සප්පායම් වෙනවා."
"ඒකනේ හැමදාම කුලී රස්සාව කරන්න වෙලා තියෙන්නේ."

සමාජ කියවීමට අනුව නාට්ටාමිලා, කුලී කරුවන්, කරත්ත අදින්නන්, බර ඔසවන්නන්
ආදී නෙක විරුදාවලීන්ගෙන් ඔවුන්ව ආමන්ත්‍රණය කළ නමුත් ලයිෆ් අපේ සමාජ
කියවීමට අනුව නම් කොළඹ කොටුවේ සැබෑ උරුමකරුවෝ ඔවුනුයි. පිටකොටුවේ රජවරු වෙන්නේ නාට්ටාමිවරුයි. සඳළු තලාවක පහස ඔවුන්ගේ දෙපයට නොදැනුනත්, ගතට සුවයක් වගේම කුසට නිසි අහරක් නොගන්නා නමුත්, මහපොළොව මත පයගසා ලෝකය එක්ක නොනවතින ගමනක ඔවුන් ගමන් කරනවා. ඉතිං ලයිෆ් අපි එක්ක කයි කරත්තයක නැගලා පිටකොටුවේ රවුමක් යන ගමන් වීදී අස්සේ අතරමං වුණු, මැරි මැරී ඉපදෙන අපේම උන්ගේ හදගැස්ම සොයා ගෙන යන්න එන්න.

ඔබ දන්නවා පිටකොටුව කියන්නේ අපේ රටේ බිහිදොර. සුපර්මාකට්වල වගේම ගම්
දනව්වල කිසිම නිනව්වක් නොමැතිව ඔබ තෝරන අල ගෙඩිය, ළූනු ගෙඩිය ඔබේ අතට
පත්වන්නට පෙරාතුව කරට ගත්ත පිරිසක් ඉන්නවා. දේශ දේශාන්තරයන්ගෙන්
වරායන්වලටත්, වරායන්ගෙන් බහාලුම්වලටත්, බහාලුම්වලින් වාණිජ්‍ය අගනගරයටත්
ඉන්පසු මෙකී නොකී සෑම ස්ථානයකට ඉදිකටුවේ සිට ආනයනය




කරන සියලුම භාණ්ඩ
ප්‍රවාහනය වන්නේ ඔවුන්ගේ කරමතින්. බොහෝ දෙනෙක්ට පිටකොටුව කිව්ව සැණින්
එසැණින් සිහියට නැගෙන්නේ අඩුවට වගේම ලාබෙට ෆැන්සි භාණ්ඩ මිලදී ගන්න
පුළුවන් ෆැන්ටසි ලෝකයක වටපිටාවක් පමණයි. විදීවල පැතිරී ගිය කලබලකාරී,
ඝෝෂාකාරී වටපිටාවක හාන්කවිසියක් නැතුවම ඔබ තෝරන සෑම භාණ්ඩයක් පිටුපසම
නාට්ටාමිවරුගේ ජීවිත ඇතුළේ කැකෑරෙන කඳුළු, දහඩිය අපුරුවට මුහු වෙලා ඇති.
සමාජයට විවර නොවුවද කොළඹ වාණිජ පුරාණය තරම්ම ඉතිහාසයක් නාට්ටාමිවරුන් සතුව පවතිනවා. ලන්දේසි පාලන කාලය තුළ පිටකොටුව තුළ වෙළඳාම පුළුල්ව පැවතුණේ නෑ. එදත් නාට්ටාමිවරු සීමිත පිරිසක් පිටකොටුවට අවැසි සේවය සැපයුවද නාට්ටාමි වෘත්තීය එතරම් ජනප්‍රිය වුණේ නෑ.

නමුත් බ්‍රිතාන්‍ය ආගමනය එක්ක පිටකොටුව ප්‍රධාන ආර්ථික මර්මස්ථානයක් බවට පත්වෙනවා. ස්වදේශික ජනතාව සුදු පාලකයන්ගේ ව්‍යාපාර යටතේ නාට්ටාමී වෘත්තිය කරන්න රුචිකත්වයක් දැක්වූයේ නැහැ. ඒ නිසාම ඔවුන් විකල්පයක් විදිහට අසල්වැසි ඉන්දියාවෙන් නාට්ටාමීවරු ගෙන්වනවා. මෙහෙම ලංකාවට ආගමනය වුණු නාට්ටාමීලා බහුතරය පිටකොටුවේ වෙළෙඳාම් කටයුතු වලට සහය වෙනවා විතරක් නෙමෙයි පිටකොටුව තුළ ඔවුන්ගේ ජනාවාස පිහිටුවා ගන්නවා. ඉතිං මෙන්න මේ විදිහට ආපු නාට්ටාමීලා බහුතරය නඩාර් වංශිකයන්. ඔවුන් පිටකොටුව ඇතුළේ ජීවිකාවට වගේම අනාගතය උදෙසාත් පිඹුරුපත් එළනවා. විවාහ වී පරම්පරාවන් රැසක් නිර්මාණය කරනවා. ඒ වෙනකොට ලාංකික ජනතාවද මෙකී නාට්ටාමී වෘත්තිය කෙරෙහි යොමු වී අවසන්. නඩාර්වරුන් යටතේ නාට්ටාමී වෘත්තිය ප්‍රගුණ කරන්න ලාංකිකයින් කටයුතු කරනවා. නඩාර්වරුන්ගෙන් නාට්ටාමී රස්සාව පුහුණු වුණු නාට්ටාමීවරු අදටත් පිටකොටුවේ ජීවත් වීම විශේෂයි. නමුත් ඒ නාට්ටාමීවරුන් විදිහට නෙමෙයි. ව්‍යාපාරිකයින් විදිහට. සමාජ, දේශපාලන, ආර්ථික විපර්යාසයන් හා පෙරළියන් එක්ක නඩාර්වරුන්ට වාණිජ්‍ය නගරය අත්හැර යළි මව් දේශයට යන්න සිදු වුණත්, ඒ වන විටත් නාට්ටාමී වෘත්තිය අපේ වාණිජ සමාජය තුළ ස්ථාපිත වී අවසන්. නඩාර්වරු දයාද කළ නාට්ටාමී රැකියාව අද ජාති, ආගම්, කුල භේදයන්ගෙන් තොරව බොහෝ දෙනෙක්ගේ ජීවන වෘත්තීය බවට පත්වෙලා. ආර්ථිකය වගේම අලි, පුටු, බුලත් කොළ, සීනු වෙනස් වුණත් කවදාවත් නාට්ටාමී රස්සාව නම් වෙනස් වුණේ නෑ.

පිටකොටුවේ වීදිවල එක් වතාවක් හෝ ඔබ ඇවිද ගොස් තිබේ නම් නාට්ටාමීවරු ප්‍රධාන කොටස් දෙවර්ගයක් ඉන්න බව ඔබට වැටහේවී. ඔවුන් වර්ගීකරණයට ලක් වෙන්නේ බර අදින ආකාරය අනුව. කරත්තවලින් භාණ්ඩ රැගෙන යන නාට්ටාමීලාට කියන්නේ කයි කරත්ත නාට්ටාමීලා කියලා. මීට අමතරව කරමතින් බර රැගෙන යන පිරිසක්ද සිටිනවා. පොදුවේ ගත්තම මේ සියලු දෙනාම සිදු කරන්නේ ජීවන බර ගෙනියන්න අනුන්ගේ බර සිය කශේරුකා මතින් වඩම්මවන එක. ඒ



වගේම ඒ ඒ තොග කඩවල් වලටම අයිති නාට්ටාමීලාද ඉන්නවා. ඔවුන් අතින් බඩු ගබඩා තුළට ගෙන ඒම හා ගබඩාවලින් එළියට ගෙන යාම සිදුවෙනවා.

නාට්ටාමීවරුන්ට මුදල් ලැබෙන්නේ ඔවුන් බර ගෙන යන ප්‍රමාණය අනුවයි. විශේෂයෙන්ම එක් බෑගයකට ගෙවන ප්‍රමාණය බෑගයේ අඩංගු බර ප්‍රමාණය අනුව එකිනෙකට වෙනස් වෙනවා. ඒ වගේම බර ගෙන යන දුර ප්‍රමාණය අනුව අය කරගන්නා මුදල එකිනෙකට වෙනස්. බොහෝ නාට්ටාමීවරුන් පවසන ආකාරයට දිනකට රුපියල් තුන්දහසක් හාරදහසක් වුවද ඉපයිය හැකියි. නමුත් බොහෝ දෙනා ඉන් වැඩි කොටසක් වැය කරන්නේ තැබෑරුමට.

පිටකොටුවට නාට්ටාමීවරුන්ගේ සේවය ලැබෙන්නේ ජාලයක් විදිහට. දිවා හා රාත්‍රී වශයෙන් ඔවුන් ජාලගත වෙනවා. ඔබ දන්නවනෙ දහවල් කාලයට පිටකොටුව ඉතාමත් කාර්යබහුලයි. භාණ්ඩ ප්‍රවාහනයට සුදුසු වටපිටාවක් හොයාගන්න එක එතරම් පහසු කාර්යයක් නොවෙයි. ඒ නිසා ගැනුම්කරුවන් වගේම තොග වෙළෙඳුන්ට අවශ්‍ය සේවය දහවල් කාලයට ලැබෙනකොට වරායවලින් ගෙනෙන සියලුම ආකාරයේ භාණ්ඩ පිටකොටුවේ ගබඩාවලට ගෙන එන්නේ මධ්‍යම රාත්‍රියෙනුත් පසුවයි. පැය 24 පුරාවට පිටකොටුවේ කොහේ හෝ තැනක ඔවුන් සේවය සපයනවා.

නාට්ටාමීවරුන්ගේ සේවය සැපයෙන ප්‍රධාන තැනක් තමයි කැළෑ පොළ. මධ්‍යම රාත්‍රියේ ඉඳලා කැළෑ පොළට ගේන එළවලු පළතුරු ටික බාන්න වගේම එහා මෙහා ගෙනියන්න උදව් වෙන්නේ මොවුන්. පාන්දර 3ට පටන් ගන්න කැළෑ පොළ හිරු උදාවෙත්ම අවසන් වෙන්නේ නොනිදා රැය පහන් කළ නාට්ටාමීවරුන්ට ඉසිඹුවක් දෙමින්. කැළෑ පොළේ වැඩ කරපු නාට්ටාමීවරුන්ට රැකියාව තියෙන්නේ ආපසු ඊළඟ දවසේ.

මැනිං පොදු වෙළඳපොළ නාට්ටාමීවරු බහුලව ගැවසෙන තවත් තැනක් . අටසියයක පමණ පිරිසක් දිනකට මැනිං පොළේ රැකියාව කරනවා. මධ්‍යම රාත්‍රියේ ඉඳලම මැනිං වෙළෙඳපොළේ වැඩ කරන නාට්ටාමීවරු උදේ දහය එකොළහ වෙනකොට වැඩ හමාර කරන්නේ තවත් නාට්ටාමීවරුන් පිරිසකට රැකියාව කරන්න ඉඩකඩ ලබා දෙමින්. මැනිං පොළේ නාට්ටාමීවරුන්ට හිමි හැඳුනුම්පතක් තිබීම සුවිශේෂී කරුණක්. මේ විදිහට පළමු, දෙවන, තෙවන, සිව්වන හා පස්වන හරස්වීදි වලද නාට්ටාමී සේවය සක්‍රීයයි. ඔබ දන්නවාද? නාට්ටාමීවරුන්ටම වෙන්වූ වැයික්කියක් තිබෙන බව. ඉන් පරිබාහිරව කටයුතු කරන්න හැකියාවක් නෑ. ඒ වගේම අලුතෙන් නාට්ටාමී වෘත්තීයට පැමිණෙන විට ලියාපදිංචි වීම අනිවාර්යයි.

වයස අවුරුදු පහළොවේ ඉඳලා වයස අවුරුදු 70 පමණ වයසැති පුද්ගලයින් දක්වා නාට්ටාමී රැකියාව කරනවා. ඇතැම් විට ඔබ මවිතයට පත්වේවි කොළඹ වාණිජ අග නගරයේ නාට්ටාමී රැකියාව කරන එක් කාන්තාවක්ද ඉන්නවා කිව්වම. ජීවත් වෙන්න මිනිස්සු නොකරන දෙයක් නොමැති තරම්. ලැබීම, දෛවය, අවාසනාව කියලා මිනිස්සු සියලු බලාපොරොත්තු අරමුණු ආපස්සට දානකොට දෛවය එක්ක ඔට්ටු වෙන මිනිස්සුත් අපි අතර නැතුවාම නොවෙයි. ඇතැම් නාට්ටාමීවරුන් අබාධිතයි. තවත් සමහරු වයස්ගත වී දුර්වලයි. ඒත් ජීවිතය අත්හරින්න ඔවුන් සූදානම් නැහැ.

පිටකොටුවේ නාට්ටාමී රැකියාවට ජාති, ආගම්, කුල, උස් පහත් භේද කිසිවක් නැහැ. සිංහල, දමිල, මුස්ලිම් නාට්ටාමීවරුන් සහයෝගයෙන් හරි අපූරුවට මේ රැකියාව කරනවා. ඇතැම් තැනක හාම්පුතා මුස්ලිම් ජාතිකයෙක් වෙනකොට නාට්ටාමී රැකියාව කරන පුද්ගලයා දමිල හෝ සිංහල. නමුත් කෙදිනකවත් ඔවුන් අතර භේද භින්නතා විරසකකම් නැහැ. හරි අපූරුවට සංහිඳියාවෙන් තාමත් පිටකොටුවේ නාට්ටාමී රැකියාව කරන මොවුන් මුලු මහත් සමාජයටම ආදර්ශයක්. පක්ෂ, ආගම්, ජාති වලට බෙදිලා අපි ගහ මරා ගත්තට පිටකොටුවේ වීදි ඇතුළේ නාට්ටාමීවරු හරිම සංහිඳියාවෙන් ඔවුන්ගේ වගේම අපේ ජීවන බරත් ඇදගෙන යන්න උදව් වෙනවා.

ගෙන්දගම් පොළවේ පය ගහලා ජීවත් වෙන්න ජීවිතය එක්ක ඔට්ටු වෙන නාට්ටාමීවරුන්ගේ වෘත්තිය අපි හිතන තරම් සියුමැලි නම් නෑ. ජනාකීර්ණ වූ පරිසරයක, කාර්යබහුල වටපිටාවක, ඇනුම් බැනුම් ගෙරවුම් තාඩන පීඩන මධ්‍යයේ තමයි ඔවුන්ට රැකියාව කරන්න සිදු වෙන්නේ. සුළු අතපසුවීමකින් ජීවිතය වුණත් නැතිවෙන්න පුළුවන්. උදේ පාන්දර කයිකරත්ත මඩුවෙන් කරත්තයක් අරගෙන වීදියට බහින ඔවුන්ගේ දවස ගෙවෙන්නේ වීදී ඇතුළේමයි. වඩේ ගෙඩියක්, පාන් කෑල්ලකින් කුස පුරවාගෙන වීදියට බහින ඔවුන්ට හරිහමන් ආහාරයක් ගන්න ලැබෙන්නේ දවසේ නිමාව තුළදී පමණයි. වෙහෙස මහන්සිය දැනුනම වීදියක් අයිනේ කරත්තය නතර කරලා කරත්තේම මදකට හෝ විඩාව නිවා ගන්නේ තවත් ‘ටිප් එකක්’ යන්න කාගෙ න්ම හෝ ඇරයුමක් ලැබෙනතුරුයි.

ඇඟපත විඩාව නිවාගන්න දෙයියෝ දුන්න අඳුරත් අරගෙන නාට්ටාමීවරු පිරිසක් නිවෙස් බලා යනකොට තවත් පිරිසක් යන්නේ රෝද දෙකේ මාළිගාවට. කරත්තය සිය නිවහන කරගනිමින් රැකියාව කරන නාට්ටාමීවරුන්ද ඕනෑ තරම්. ග්‍රෑන්ඩ්පාස්, වැල්ලවත්ත, මට්ටක්කුලිය, වත්තල ආදී ප්‍රදේශවලින් මෙන්ම දුර බැහැර ප්‍රදේශයන්ගෙන්ද පැමිණ රැකියාව කරන පිරිසක් නාට්ටාමීවරුන් අතර ඉන්නවා.

නාට්ටාමීවරයෙකුගේ ජීවිතය කොයි මොහොතේ කුමන ආකාරයෙන් අහිමි වේ දැයි ඔවුනට

විශ්වාසයක් නෑ. මේ රැකියාව කරන



බොහෝ දෙනා කියා සිටින්නේ වෙන රැකියාවක් නොමැතිකම නිසා නාට්ටාමී රැකියාව කරන බවයි. කාලයාගේ අවෑමෙන් විවිධ රෝගාබාධයන් ඔවුනට වැළඳී ඇති බව ඔවුන්ම ප්‍රකාශ කරනවා. ලැබූ මිනිසත් බව අත්නොහරිමින් ජීවිතය එක්ක ඔවුන් පොර කෑ නමුත් හෙටක් ගැන විශ්වාසයක් ඔවුන් තුළ දක්නට ලැබෙන්නේ හරිම අඩුවෙන්.

නාට්ටාමී වරුන්ගේ දෛනික දින චර්යාවේ තහනම් සහ අහිතකර වැඩවලින් නම් ඉවරයක් නැහැ. ඇතැම් නාට්ටාමී වරු දවස පුරාවට මත්පැන් පානය කරමිනුයි මේ රැකියාව කරන්නේ.

කිලෝ දෙතුන් දාහක් වීදි අතරින් එහා මෙහා ගෙනියන එක එතරම් ලෙහෙසි පහසු කටයුත්තක් නෙමෙයි කියලයි ඔවුන් කියන්නේ. ඒ නිසාම ඇඟට වේදනාව, මහන්සිය නොදැනෙන්න යහමින් මතින් සප්පායම් වෙනවා. පිපාසය, වෙහෙස, මහන්සිය සහ වේදනාව නිවා ගන්න ඇතැම්හු කහට කෝප්පයක්, සරුවත් වීදුරුවක් බොනකොට තවත් සමහරු මත්ද්‍රව්‍ය ගන්නේ වේදනානාශකයක් විදිහට. උදේ පාන්දරම දවසේ ගතමනාව හොයා ගන්න නිවෙස්වලින් එන ඇතැම් නාට්ටාමීලා රැය පහන් කරන්නේ පිටකොටුවේ වීදිවල ඉන්න රෑ සමනළියන් එක්ක. දවස තිස්සේ හොයපු සේසතම පූජා කරාම ඊළඟ දවසේ කුලියට කරත්තයක් ගන්නවත් මුදලක් ඔවුන් ළඟ ඉතිරි වෙන්නේ නෑ.

පිටකොටුව ජනාකීර්ණ නොවන නිමේෂයක් සොයන්නට නොහැකි තරම්. උදාවූ හිරු බැස

යද්දීත්, බැසගිය හිරු යළි නැග එද්දීත් මේ වාණිජ අගනගරයේ නොනිදා රැය පහන් කරන පිරිසක් සිටී නම් ඒ නාට්ටාමීවරුන් පමණයි. පිටකොටුවේ ජනාකීර්ණ බව එක්ක වාණිජ්‍ය නගරයට යන එන තොග වෙළෙඳුන්ට වගේම ගැණුම්කරුවන්ටත් භාණ්ඩ මිලදීගත් පසු එකී භාණ්ඩ ප්‍රවාහණය කිරීම විශාල ගැටලුවක්. වීදිවල පටු බව එක්ක රථවාහන යොදා ගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. එවැනි පසුබිමක පිළිතුරක් පවතින්නේ එක් පිරිසක් අත පමණයි. සිය උර මතින් හෝ කරත්ත මගින් අවශ්‍ය ස්ථානයට ඔවුන් භාණ්ඩ රැගෙන යනවා. ඒ වගේම වරායවලින් ගෙනෙන මහා බහාලුම් රථවලට පිටකොටුවේ වීදි අතරින් ගමන් කිරීම එතරම් පහසු කාර්යයක් නොවෙයි. මෙවැනි පසුබිමක් තුළ පිටකොටුව තුළටත් කොටුවෙන් පරිබාහිරටත් භාණ්ඩ ප්‍රවාහණයට නාට්ටාමී සේවය අත්‍යාවශ්‍යයි. නාට්ටාමීවරුන් නොමැති ආර්ථිකයක්, නාට්ටාමීවරුන් නොමැති වාණිජ්‍ය නගරයක් ගැන සිතන්නටවත් නොහැකි තරම්.

ලයිෆ් අපේ කියවීමට අනුව නම් අපි හැමෝම නාට්ටාමීලා. නමුත් හදවතට එකඟව එහෙම

හිතන්න අපි අකමැතියි. අපි කරන්නෙත් ජීවිතය පුරාවටම ජීවත් වෙන්න අනුන්ගේ බර

අදින එක. පිටකොටුව කියන්නේ අපේ සමාජයේ එක් පැතිකඩක් පිළිඹිබු කරන කැඩපතක්. මහා සමාජයෙන් පිටකොටුව කියන්නේ එක්තරා සාම්පල් එකක් විතරයි. නාට්ටාමීවරු වගේම තවත් ඇසට හසු නොවුණු, සමාජ කතිකාවක් හදන්න අකමැති නමුත් හඬ අවදි කළ යුතු මිනිස්සු ඕනෑතරම් අපේ සමාජය තුළ ඉන්නවා. පිටතින් කෙනෙක් දිහා බලලා තීරණ ගන්න එපා. මුලින්ම ඔබ ඔබව දකින්න උත්සාහ කරන්න. එවිට තවත් දෙනෝ දාහකගේ හදගැස්මට සවන් දෙන්න ඔබට හැකි වේවි.

**නිරෝෂා සදමාලී**
**ජනසන්නිවේදන අධ්‍යයනය අංශය**
**කැළණිය විශ්වවිද්‍යාලය**

# අවදානම් සහගත පියයුරු පිළිකාවෙන් ආරක්ෂා වෙමු

කාන්තාවක් වශයෙන් සිය ජීවිතය තෘප්තිමත්ව ගත කිරීමට නම් නිරෝගී කම සහ සෞඛ්‍ය සම්පන්න බවද ඇයට ඉතාමත් වටින සාධකයන් වනවා. වර්තමාන තත්ත්වයට අනුව විශේෂයෙන් කාන්තාවන්ට වැළදෙන දරුණුතම රෝගී තත්ත්වයක් ලෙස පියයුරු පිළිකාව හඳුන්වන්නට පුළුවන් රෝගයක් වෙනවා. අද අපගේ වෛද්‍ය සාකච්ඡාවක් අප කතා කරන්නට සූදානම් වන්නේ මෙම පියවරු පිළිකා රෝගී තත්ත්වය පිළිබඳවයි.

ලංකාවේ කාන්තාවන් බහුලමව වාර්තා වන පිළිකාව වන්නේ පියයුරු පිළිකාවයි. පිය යුරු පිළිකාවක් නිර්මාණය වෙන්නේ පියවරුවල පියවරුවල කිරි කිරි නිපදවන ග්‍රන්ථිවල ග්‍රන්ථිවල හෝ හෝ එම එම ග්‍රන්ථිවල සිට කිරි කිරි රැගෙන යන නාලවල හෝ හෝ අවට සම්බන්ධතා පටකවල සෛල අසාමාන්‍ය ලෙස පාලනයකින් තොරව



ආක්‍රමණකාරී ලෙස වර්ධනය වීම මගිනි.

මෙම පියයුරු පිළිකා තත්ත්වය තුළ බහුලව හමුවන රෝග ලක්ෂණ ලෙස පිය යුරු දෙකේ අලුතින් ඇති වූ ප්‍රමාණවල වෙනසක්, පියයුරුවල කොටස් දෙකක් ඇතුළට නෙරා යාමක්, පියපුරුවල ගැටිත්තක් ඉදිමීමක් පිය යුරුවල සමයේ ඝනවීමක් පැහැයේ වෙනසක් ඉදිමීමක් ඉදිමීමක් ඉදිමීමක් දොඩම් දොඩම් ලෙල්ලක ලෙල්ලක මතුපිට වැනි ස්වභාවයක් තණ පුදු පිය යුරු තුළට නිරායාමක් හෝ වෙනසක් තණ පුටුවලින් සිදුර පැහැයෙන් හෝ ලේ පැහැයකින් දියරයක් ශ්‍රාවය වීමක් පිය යුරුවල අසාමාන්‍ය වේදනාවක් දැක්විය හැකිය.

මෙම පියයුරු පිළිකාවක අවදානම අවදානම තිබෙන්නේ විශේෂයෙන් විශේෂයෙන් කාන්තාවන්ට වන අතර මෙහිදී තරුණ පිරිසට වඩා වඩා වයසට යන කාන්තාවන් ම පිය යුරු පිළිකාව ඇතිවීමට ඇති ඇති ප්‍රවණතාවය ඉහළය. තවද අඩු වයසක දී වැඩිවියට පත්වීම හා ආර්ථවහරණය ප්‍රමාද වී සිදුවීම සිදුවීම යන කාණ්ඩවල කාණ්ඩවල සිටින කාන්තාවන්ට පියයුරු පිළිකා තත්ත්වය ඇතිවීමට වැඩි වැඩි ප්‍රවනතාවයක් දක්වයි.





මීට අමතරව පළමු දරුවා ඉපදීමට හෝ ගැබ් ගැබ් ගැනීම ප්‍රමාද වීම හෝමෝන ප්‍රතිස්ථාපන ප්‍රතිකාර දිගු කාලීනව ලබාගන්න කාන්තාවන් උපත් පාලන පාලන පෙති පෙති පෙති පෙති දිගු දිගු කාලීනව ලබා ලබා ගැනීම, මධ්‍යසාරමධ්‍යසාර භාවිතය භාවිතය අධික මේද සහිත සහිත සහිත සහිත ආහාර අනුභව අනුභව කිරීම ශාරීරික ශාරීරික ශාරීරික ව්‍යායාම අවම වීම ස්තූල බව බව මෙන්ම පිය යුරු පිළිකා පිළිකා සඳහා පවුල් පවුල් ඉතිහාසයක් ඇති කාන්තාවන් මේ මේ අවදානම් අවදානම් පිරිස ලෙස හඳුන්වා දිය හැකිය.

පිය යුරුවල ඇති ගැටිති සෑම එකක්ම එකක්ම පිළිකාමය පිළිකාමය ගැටිත්තක් ගැටිත්තක් නොවන නොවන අතර එය පැහැදිලිව පරීක්ෂා කර පිළිකාවක්ද පිළිකාවක්ද පිළිකාවක්ද යන වග මුල් අවස්ථාවේම හඳුනාගත යුතුය. පියයුරුවල ඇති විය හැකි පිළිකා නොවන



ගෙඩි හෝ ගැටිති ගණනාවක් ඇත. එයින් එක් ගැටිත්තක් ලෙස සයිබ්‍රෝ ඇසිනෝමා නමැති ගැටිති වර්ගය හඳුන්වා දිය හැකිය. තවද පිළිකාමය නොවන ගැටිත්තක් කලාතුරකින් පසු කාලයේදී පිළිකාවක් බවට පරිවර්තනය වීමට ඉඩ ඇත.

මෙම පියයුරු පිළිකා තත්ත්වය වැළඳී ඇතිද ගැටි නැතිද යන වග පරීක්ෂා කිරීමට ක්‍රම කීපයක් ඇත. සාමාන්‍යයෙන් අවුරුදු 20-70 ත් අතර කාන්තාවන් මසකට වරක් ස්වයං පියයුරු පරීක්ෂා කරගත යුතුය. මෙහිදී තමන්ගේ පියයුරු සම්බන්ධව තමන්ට හොඳ අවබෝධයක් ලැබෙන අතර ගෙඩි හෝ වෙනසක් තිබුණහොත් වෛද්‍යවරුන්ටත් වඩා හොඳ අවබෝධයක් තමන් සතුව පවතී. තවද සායනික පියයුරු පරීක්ෂාවද සිදු කළ හැකි අතර මෙහිදී පුහුණුවලත් සෞඛ්‍ය නිලධාරිනියක් හෝ වෛද්‍යවරයෙක් ලවා අවුරුදු 40ට වැඩි වයසැති සෑම කාන්තාවක්ම වසරකට වරක් තම පියයුරු පරීක්ෂා කර ගැනීම සිදුකළ හැකිය. නමුත් මෙම පරීක්ෂණ දෙකේදීම හසු නොවන පිළිකා හඳුනා ගැනීමට මැමෝග්‍රෆි පරීක්ෂාවක් සිදු කරනු ලැබේ. එක්ස් කිරණ අඩු මාත්‍රාවක් යොදා ගනිමින් පියයුරෙහි ඇතුළත පටක නිරීක්ෂණය කරනු ඇත. මෙම පරීක්ෂාව අවුරුදු 40ට වැඩි කාන්තාවන්ට සිදුකරන කරනු ලබන අතර මෙය බොහෝ වේලාවකට Ultra Sound Scan පරීක්ෂණය සමඟ එකතු කර සිදුකිරීමේ එහි සංවේදීතාව වැඩිවේ.


මේ ආදී වශයෙන් මෙම හඳුනා ගැනීම සිදු කිරීම මගින් මෙම පියයුරු පිළිකා තත්ත්වය හඳුනා ගැනීමට හැකියාවක් ඇති අතර එම තත්ත්වය වර්ධනය වීමට ඇති ඉඩ කඩද අවම කර ගැනීමටද මෙමඟින් හැකියාවක් ලැබේ.

**සටහන**
**හංසිකා ලියනගේ**
**කැලණිය විශ්වවිද්‍යාලය**

ශ්‍රී ලංකාවේ ඩිජිටල් පුවත්පත කලාවේ
නව හැරවුමට ඔබටත් ආරාධනා ....

ශ්‍රී ලංකාවේ ඩිජිටල් පුවත්පත් කලාවට එක් වෙන

# THE WEDDING STORY







මැගසින් එක
කියවන්න
Wedding story
facebook
පිටුවට එක් වන්න

## ඔබේ අලංකාර මංගල ඡායාරූප සවිස්තරාත්මකව පළ කරගන්න.

---

ඔබේ රූපලාවණ්‍ය හැකියාවෙන් හැඩ කළ මනාල මනාලියන් පිළිබඳ විස්තර අපට එවන්න.

---

අපේ කණ්ඩායම සමඟ එක්ව ඔබේ මාවත එළි කරගන්න.

**+94 71 686 1825**

# ජීවිතයේ හොඳ ප්‍රතිචාරවලට පමණක්ම focus එක දෙන්න!!!



**ආයුබෝවන් යොහානී! කොහොමද මේ දවස්වල ඔබේ කාර්‍යබහුල ජීවිතය ගෙවෙන්නේ?**

ආයුබෝවන්, Pink womanzs magazine, ඉතාමත් සතුටින් තමයි මේ දවස්වල කාලය ගෙවෙන්නේ. මම හරිම කැමතියි කාර්‍යබහුල ජීවිතයක් ගත කරන්න. මේ මගේ ආසම කරන කාලයක් ඉතින්, මම මේ දවස්වල මගේ වැඩ හොඳින් කරගෙන යනවා. මම focus කරන්නේ releases වල diamonds කියන Edward Maya එක්ක කරපු track එක release වුනා, ඒවගේම " කෙල්ල" කියන ඇල්බමයත් release වුනා. ඒ වගේම තව ගොඩාක් එන්න තියෙනවා, ලබන මාසේ ඉන්දියාවටත් යන්න තියෙනවා. ඉතින් එහෙම තමයි, ජීවිතය ගෙවෙන්නේ මේ දවස්වල.

**ඔබ දැනටමත් ලංකාවට පමණක් නෙවෙයි, මුළු ලෝකයටම ආඩම්බරයක් වගේම brand එකක්, ඔබ ආ ගමන් මග නැවත මතක් කලොත්.....................**

හ්ම්, මෙහෙමයි, මම පොඩි කාලයේ ඉඳලා, music කලා. මම පාසැල් කාලයේ, western band එකෙත් හිටියා. ඒ වගේම, පියානෝ වාදනය, ගිටාර් වාදනය ඒ දේවල් මම ඉගෙන ගත්තා. නමුත් මම focus කලේ, corporate life එකක ජීවිතය ගත කරන්නයි. මම CMAGM කියන shipping line එකේ මම රැකියාව කලා. ඒවගේම ඇකෝලේඩ්, FRP, vehicle parts manufacturing company- ජාඇල, මේ වගේ විවිධ රැකියා වල



මම නිරත වුනා. මේ යන ගමනේදී මම උසස් අධ්‍යාපනය හදාරන්න England වලට යනවා. ඒවගේම bachelors එකට නැවතත් මම ලංකාවට ආවා, සර් ජෝන් කොතලාවල ඩිෆෙන්ස් යුනිවර්සිටි එකට. Supply chain management වලින් bachelor එකක් කරන්න. ඊට පස්සේ මට හිතුනා, corporate පැත්ත වැඩිදියුණු කර ගන්න ඕස්ට්‍රේලියාවට ගිහින් masters degree එකක් කරන්න accounting වලින්, එහෙම තමයි මගේ අධ්‍යාපන පැත්ත හැදුනේ. ඒ අතුලේදී, මගේ සංගීත වැඩ කටයුතුත් ටික ටික කරගෙන ගියා. මම masters කරද්දී තමයි මගේ මුල්ම youtube channel එක හැදුවේ. ඉතින් ඒ වර්ෂ 2016 දී, 2019 වර්ෂයේදී මම අධ්‍යාපන කටයුතු අවසන් කරලා, නැවතත් ලංකාවට ආවා. සංගීතය වෘත්තියක් වශයෙන් හදාරන්න. ඉතින්, ඒ 2019 වර්ෂයේදී, පටන් ගත්තු මේ ගමන තමයි, දැන් මම යමින් පවතින්නේ. මෙහිදි මට විවිධ දේවල් වුනා. මගේ රැප් එකක් viral වුනා ඒ කාලයේදී, ඒවගේම , මැෂබ් එක වුනා. driving කොන්සර්ට් එක, covid කාලයෙන් පස්සේ



"මැණිකේ මගේ හිතේ" සිංදුවත් එක්ක මගේ ජීවිතය හුඟාක් වෙනස් වුනා. එහිදි මට ඉන්දියාවට යාමට අවස්ථාව ලැබෙනවා. තාමත් මම ඉන්දියාවේ තමයි පදිංචිය.. සිංදු 8, 9, ක් වගේ කලා , විවිධ භාෂා වලින් ඉන්දියාවේදී . හේතුව මම, T series එකත් එක්ක sign කරපු නිසා, artist කෙනෙක් විදිහට එයාලගේ රෝස්ටර් එකේ. මේ අවුරුද්දේ මම නැවතත් මගේ ලංකාවට ආවා මගේ "කෙල්ල" ඇල්බමය release කරන්න. එම ඇල්බමයේ සිංදු 14 ක් අඩංගු වෙලා තියෙනවා.







ගිය සතියේ diamonds" Edward Maya සමඟින් මම අළුත් song එකක් release කලා. ඉතින්, තාම මම මේ ගමන යනවා. ඉදිරියේදී මම දන්නේ නැහැ මොනවා වේවිදෝ කියලා. මේක තමයි ඉතින් මම පැමිණි ගමන් මඟ.

**කුඩා කාලයේ ඔබට මොනවගේ aim එකක්ද තිබුනේ?**

කුඩා කාලයේදී මට හරියටම aim එකක් තිබුනේ නැහැ මොනවාද කරන්න ඕනී කියලා. මට doctor කෙනෙක්, lawyer කෙනෙක්, වෙන්න ඕනා කියන මතයේ මම හිටියේ නැහැ. හැබැයි මට ඕනා වුනා, කරන ඕනෑම දෙයක් හොඳටම කරන්න. ඉතින්, මගේ අම්මා, තාත්තා මාව push කලේ නැහැ, මෙ දේ කරන්න, අර දේ කරන්න කියලා. මට උපරිම නිදහස තිබුනා. විවිධ දේවල් එරහ කරලා මටම ආවේනිකවු දෙයක් හොයා ගන්න.

**ඉන්දියාවේ ගෙවුනු ජීවිතය ගැන කතා කලොත්.**

ඉන්දියාවේ තමයි මම තවමත් සිටින්නේ. ඒ ජීවිතය නම් හරිම වෙනස්. ලංකාවත් එක්ක compare කරද්දී, අපේ රට තුළ ගත කරන ජීවිතය ඉතාමත් සරලයි. හැබැයි මේ මගේ මතය පමණයි. ඒ රටේ හැමදේම ඉතාමත් වේගවත්, competition තියෙනවා. 1.4 billion ජනගහනයක් ඉන්න රටක්. හැබැයි ඉගෙන ගන්න දේවල් නම් හුගාක් තියෙනවා. Artist ලාගෙන්, production එකෙන්, ඇත්තෙන්ම ඒක වෙනමම තැනක්. හැබැයි මම ඒ ගෙවන ජීවිතයට හුඟාක් කැමතියි. මොකද, මම මුලින්ම සඳහන් කලා මම කාර්‍යබහුල ජීවිතයකට හුඟාක් කැමතියි කියලා. ඉතින් මට ඒදේ ගැළපෙනවා කියලා කියන්න පුළුවන්.



**ඉන්දියාවේ ඔබට famous celebrities ලව ඔබට ආශ්‍රය කිරීමට අවස්ථාවන් ලැබුනා, මොනවාද ඒ අයගෙන් ඔබට ලැබුනු අවවාද සහ අත්දැකීම්?**

ඇත්තෙන්ම මට ඒ සුවිශේෂී අවස්ථාව ලැබුනා. නම් වශයෙන් කිව්වොත්, සලමන් ඛාන්, රන්වීර් සිං, අමීර් ඛාන්, ටෝනි කක්කර්, නේහා කක්කාර්, තමන්නා, මලයිකා, etc. මේ ඔක්කොමලා මට හුඟාක් උදව් කලා. මොකද, ඒ අයත් කැමතියි වෙන රටක ඉඳලා ආපු කෙනෙක්ට, කොහොමද මේක වෙන්නේ, මට හුඟාක් උදව් කලා ජුගින් නෝටියාර්, මම එයා සමඟ tracks තුවක් කලා. චෝදරී, මැණිකේ සහ තු සාමනේ ආයේ කියන චර්ජනි තුන. මම එයා එක්ක තමයි බොහොමයක් නිර්මාණ වලට සම්බන්ධ වුනේ. ඒ අය මට කිව්වේ, මම දැනට අවුරුදු දෙකක් වෙනවා ඉන්දියාවට ගිහිල්ලා. නමුත් අවුරුදු 7 ක් 8 ක් පමණ ඉන්න ඕනා තැනක්, ඒ අයත් උත්සාහ කරලා තමයි අද හොඳ තැනක ඉන්නේ. කිසිම දෙයක් give up කරන්න එපා. ඒ අය ගිය මාර්ග යන් මට කියලා දුන්නා. ඉතින්, මට ඒ අය හුඟාක් උදව් කලා මම ඉන්දියාවේ සිටිය කාලය ගෙවන්න.




**ඔබ අද කිසියම් තැනක සිටිනවා නම්, ඒ ඔබේ නිහතමානී ලෙන්ගතු කම සහ සිනහවයි. ලෝකයක් දිනුවත් යොහානි කියන්නේ ඒදත් අදත් ඒ වගේමයි. කොහොමද මේ වගේ චරිතයක් වුනේ?**

ඒ ගැන ඉතින් හොදටම දන්නේ ඔයාලා. හැබැයි, මට මේ හැමදේයක්ම ලැබිලා තියෙන්නේ මගේ අම්මා සහ තාත්තා ගෙන්. මේ ගැන මගේ පළමුවෙනි ගීතයෙන් කියනවා. "ආයේ" කියන සිංදුවෙන්. "අපි ගොඩ ගහ ගෙන, මැරෙන වලට අරන් යන්නේ හෙට සැරිසරනවද, තව කෙනෙක් ගොඩයන, හිනාවෙලා පිනට දෙන්න දානයක්ම ලෙස ", ඒ වගේම එතනින් කියන දෙයක් තමයි, ලොඩක් වෙලාවට, මොනවාහරි වෙලා මට වැරදුනොත්, මම මොනවාහරි වැරදි තීරණයක් ගත්තොත් හරි, හැම මොහොතකම මගේ සිත යන්නේ මේ සිංදුවටයි. මොකද, අපි කොපමණ achieve කලත්, කොපමණ ඉහළට ගියත්, තමාගේ නිවසට ඇවිත්, තමා කව්ද කියලා නොදන්නවා නම්, ඒ ප්‍රශ්නයක්. මම දන්නවා, මට ඕනී සේ මොනවාද, මම ජීවත් වෙන්නේ ඇයි, මම වැඩ කරන්නේ ඇයි කියලා, ඉතින් ඒ ටික මම හරියටම හිතේ තබා ගතහොත්, අනෙක් කිසිම දේක අදාළත්වයක් නැහැ.

**ලංකාව තුළ reality shows තමයි ultimate goal එක, ඉන් ඔබ්බට යන්නේ නැහැ එහෙම නේද?**

ඒක රඳා පවතින්නේ artist ලා මතයි. Goal එක මතත් depend වෙනවා. ඒක සාපේක්ෂයි artist ට. කෙනෙක් ඉන්න පුළුවන්, පොඩි කාලයේ ඉඳලා එයාගේ goal එක, reality show එකක් දිනන්න ඕනී කියල හිතනවා නම්, ඒක තමයි ඒ අයගේ goal එක වෙන්නේ.

තව කෙනෙක් ඉන්න පුළුවන්, independent අවස්ථාවන් එක්ක නැතිනම් ලේබල් එකක් sign කරලා එන්න, ඒ දේ එකිනෙකාගේ goals අනුව වෙනස් වෙනවා. මට කියන්න බැහැ. එය ඔබ්බට ගමන් කරනවාද, නැද්ද කියලා. හැබැයි ඉතින් එකිනෙකාට විවිධ වු goals තියෙනවා.

**ඔබ අවස්ථානුකූලව fashion කරනවා. කොහොමද ඒ දේවල් තෝරා ගන්නේ?**

මම කුඩා කාලයේ ඉදලම fashion වලට හුඟාක් කැමතියි. මගේ මව සහ පියාගෙන් තමයි මට ඒ අභාෂය එන්නේ. Music වලටත් මම හිතන්නේ fashion කියන්නේ තමාගේ personality එක පෙන්නන්න පුළුවන් එක තැනක්. ඒක ගොඩක් strong ද, මට ගැලපෙන විදිහට මම මගේ fashion එක හදාගෙන තියෙනවා. මම හුඟාක් research කරනවා. Fashion shows සහ international fashion trends බලනවා. ඉතින්, ඒ දේවල් වලින් තමයි, මම fashion තෝරා ගන්නේ. ඒවගේම දැන් ඉන්නවා Lovi ceylon කියන brand එකත් එක්ක මම ගොඩාක් සමීපව කටයුතු කරනවා. අසංග ඩීනස් සහ නතාලියා ලියනගේ සමග. ඒ දෙදෙනාම මටඋදව් වෙනවා මගේ fashion වලට මේ දවස්වල. මම interview යනකොට, performance එකක් කරනකොට, ඒ අය එක්ක මම වැඩ කරනවා, එවගේම කෙල්ල ඇල්බමය මගේ mission එක තිබුනේ ලංකාවෙන් ලෝකේට කියන දේ. මම ලංකාවට පැමිණි පසු මට Lovi ceylon එක මට හමුවුනා. එයාලාගෙත් similar mission එකමයි තියෙන්නේ ලංකාවෙන් ලෝකේට කියන දේ. ඉතින් ඒ දේ මටත් ගැළපුනා. ඉතින් අපි හැමෝම දැන් ඉදිරියට යනවා. මම හිතනවා මේක හොඳ ඇරඹුමක් කියලා.

**ආදරය ගැන ඔබට දැනෙන හැඟෙන දේ..**

ආදරය ගැන මම බොහෝ තැන් වල ප්‍රකාශ කරලා තියෙනවා. විශේෂයෙන්ම මගේ සිංදු වල, ආදරය කියන්නේ තියෙන්නේ ඕනී දෙයක්. හැමෝටම, ආදරය නොමැති නම් ජීවිතයක් නැහැ. ජීවිතය රඳා පවතින්නේ ආදරය මතයි. හැබැයි මට නම් ආදරය නොඅඩුව ලැබෙනවා. හැමෝගෙන්ම ලැබෙනවා,



මට ප්‍රේක්ෂක ආදරයත් එලෙසමයි. මමත් ඒ සියළුම දෙනාටත් හුඟාක් ආදරෙයි.

**හොඳ සහ නරක හැම ප්‍රතිචාර වලටම අපි මුහුණ දිය යුතුයි. විශේෂයෙන්ම නරක ප්‍රතිචාර වලට react කරන්නේ කොහොමද? කල යුත්තේ කොහොමද?**

Re act කරන්නම එපා. ඒ දේවල් වලට re act නොකර ඉන්න. එහෙම තමයි මම ඒ දේවල් වලට මුහුණ දෙන්නේ. තමාට බනින අයට focus කරන්න කිවුවොත් හොඳ කියන අයගේ focus එක නැති වෙනවා. හොඳ කියන අයව focus කරන්න එපමණක් ඇති. React කරන්න යන්නම එපා.

**ඔබ international brand ambassador කෙනෙක් නේද?**

Internationally brand ඇම්බැසිඩර් කෙනෙක් කියනවාට වඩා, ලංකාව නියෝජනය කරන ගායිකාවක් කියලා කිව්වොත් මම නිවැරදියි. මම කොහේ ගියත්, මම ශ්‍රීලාංකීක කෙනෙක් කියලා හැමෝම මාව දන්නවා. ඒක මට ගොඩාක් ලොකු ගෞරවයක් වගේම ආදරයක් කියලා කියන්න පුළුවන්.

**යොහානි, artist කෙනෙකුගේ value එක මනින නිර්ණායකය කුමක්ද?**

නිර්ණායකය කියලා කිව්වොත් ඔහුගේ හෝ ඇයගේ body of work, ඒ කියන්නේ, ඒ artist කරලා තියෙන නිර්මාණ, කොපමණ වැඩ ප්‍රමාණයක් කරලා තියෙනවාද? සිංදු 10-15 ක ප්‍රමාණයක් ද එහෙම නැතිනම් සිංදු 200 ක ප්‍රමාණයක්ද, එයාගේ සිංදු හදපු tracks තියෙනවාද, ඒ කොච්චර ප්‍රමාණයක් වැඩ කරලා තියෙනවාද කියලා තමයි මම බොහෝ දුරට බලන්නේ. event collaborate කරන කොට හරි feature කරන කොට හරි, views සහ ඒකට වැඩිය, බලන්න ඕනා brand එකක් විදිහට ඔහු/ ඇය විසින් නිර්මාණට කොපමණ true to your heart ද කියන දේ තමයි බැලිය යුත්තේ.

**"කෙල්ල" ඇල්බමය සහ Diamonds ගීතය ගැන කතා කලොත්,,**

"කෙල්ල" ඇල්බමය නම් හුඟාක් සාර්ථකයි. තව vedios හුඟාක් එන්නත් තියෙනවා. "කෙල්ල" කියන ඇල්බමයේ tracks 14 ක් තියෙනවා. තවත් ටික ටික music vedios ඉදිරියේදී release කරන්නත් තියෙනවා. ඒවගේම diamonds, මම Edward Maya එක්ක කරපු song එක මගේ ජීවිතයේ වගේම carrier එකේ මට ලැබුනු ලොකුම අවස්ථාවක් කියලා කියන්න පුළුවන්. Edward Maya කියන්නේ, හොඳ මියුසිෂියන් කෙනෙක්, හොඳ සබටැර කෙනෙක්, lyrics writer කෙනෙක්. ඔහුත් එක්ක එකට වැඩ කරන්න ලැබුනු එක ඇත්තෙන්ම භාග්‍යයක්. ඩිලන්ජන් සෙනෙවිරත්න තමයි, මේ song එකේ sinhala lyrics කලේ. ඒවගේම, මේ song එකේ මුලින්ම තිබුනේ English lyrics විතරයි, ඔන්න ඔය විදියට තමයි diamonds කියන song එක හැදුනේ.

**ඔබගේ ඉදිරි බලාපොරොත්තු සහ වැඩකටයුතු මොනවාද?**

මම නැවතත් මේ අවුරුද්දේ, අප්‍රියෙල් වල ඉන්දියාවට යනවා. ඉදිරියේදී recording වැඩ තියෙනවා, production වැඩ තියෙනවා, එකවර රටවල් දෙකක, වැඩ කරන්න ටිකක් අසීරුයි, ලංකාවේ වැඩ අවසන් වුවායින් පසු ඉන්දියාවේ වැඩ භාර ගන්නවා, ඉන්දියාවේත් වැඩ ගොඩාක් ඉදිරියේදී එන්න තියෙනවා.

**ෂමිලා ප්‍රසංගනී ප්‍රනාන්දු**

# සිතුමිණි, දුලක්ෂි සහ මහේෂිගේ හැඩවැඩ!!!






අපි මෙවර සුන්දර මනාලිය පිටුව සරසන්නේ වෙනස්ම විදිහකට. ජීවිතයේ ලස්සනම දවසට පිය නගන යුවතියන්ටයි මේ ආදරණීය පිටුව වෙන් වෙන්නේ. ඉතින් අද මනාලියන් තිදෙනෙක්ගේ සුන්දරත්වය ඔබ එක්ක බෙදා හදා ගන්නයි මේ වෑයම.

සිතුමිණි ප්‍රනාන්දු උඩරට මනාලිය ලෙසත් නූතන මනාලියන් ලෙස දුලක්ෂි රත්නායක සහ මහේෂි බණ්ඩාර සැරසී සිටී.

වෙනදා වගේම ඇඳුම් නිර්මාණය හේමාලි ලියනගේ විසින්. සුදු සහ ගෝල්ඩ් වර්තමානයෙන් යුතු ඇඳුම් නිර්මාණයට වැඩි ඉඩ කඩක් දී ඇත.





ආභරණ සියක් රූ බ්‍රයිඩල්.මල් බොකි නිර්මාණය සරත් සූරසිංහ විසින්.

කැමරාකරණය කළේ ක්‍රිෂාන් ක්‍රිෂ් විසින්.ඡායාරූප ගැනීමට ස්ථානය තේරීමේදී වයිට් ඊජන ටරදමබ එකක් සහිත ස්ථානයක් තෝරාගෙන ඇත. ඡායාරූප ගැනීමේදී නරඹන්ගේ හිත් ඇද ගන්නා ආකාරයට කැමරා රූප රාමු ගෙන ඇත.

සිතුමිණිගේ සාරිය හෑන්ඩ් මේඩ් එකක්. බ්‍රයිඩල් සෙටින් වලින් නිර්මාණය කර ගෙන ඇත. අත් වලට ටසල් සහ පර්ල් යොදා ගැනීම තුළින් වඩාත් ලස්සන බවක් ගෙන දෙයි.ඇගේ සාරිය සාම්ප්‍රදායික බවක් උසුලයි. ශ්‍රේඩින් උපයෝගී කර ගෙන ඇති නිසා සාරියේ වර්ණවත්ව බව ඉහළ ගොස් ඇත. නෙරිය උල් හැඩයෙන් සහ අත් වලට සහ පිටට ලොකු ටසල් දමා ඇත.ඇගේ ස්වරූපය නිසා ඒ විලාසිතාව ඇයට හොඳින් ගැළපේ.ඇය හංස දේනුවක් සේය.

ඇයට සාම්ප්‍රදායික ආභරණ කට්ටලයක් යොදා ගැනීම තුළින් උඩරට මනාලියගේ හැඩය ගෙන දක්වයි. හිස් පළඳනාව රතු හා ගෝල්ඩ් ස්වාභාවික මල් වලින් අලංකාර කර ඇත.

සිතුමිණිගේ මල් කළඹ ස්වාභාවික සුදු මල් වලින් හා ගෝල්ඩ් වර්ණයෙන් යුක්ත වන අතර ඇගේ සාරියට පෙනුමක් ලබා දෙයි.

දුලක්ෂිගේ සාරිය නූතන මනාලියක්ගේ ස්වරූපය ගෙන්වයි.ඇගේ සාරිය බ්‍රයිඩල් කට් වර්ක් සහ වැලෙන්ටිනා රෙද්දෙන් නිර්මාණය කරගෙන ඇත. ඇගේ සාරි හැට්ටය අත් වලට ලොකු නෙට් සහ පිහාටු ලෙසට නිර්මාණය කර ඇත.ඇය සිහින් සිරුරක් හිමි යුවතියක් නිසා එයින් ඇගේ සුන්දරත්වය තවත් වැඩි වී ඇත.

ඇගේ ආභරණ ගත් විට සරල මාලයක්,කරාබු දෙකක්,තැල්ලක් යොදා ගෙන ඇත.කොණ්ඩ විලාසිතාව පැත්තෙන් කතා කරන විට නෙට් බන් එකක් සහ රෝස පැහැති මල් යොදා අලංකාර කර ඇත.

ඇගේ මේකප් එක මූණේ ස්වරූපය එක්ක රෝස පැහැයෙන් සහ ලිප්ස්ටික් ලා වර්ණයෙන් යොදා ගෙන ඇත. කොණ්ඩය දෙපැත්තට බෙදෙන විදිහට සකසා ඇත.

ඇගේ මල් බොකිය කෘතිම ස්වරූපයක් ගනී.

මහේෂිකා ගිහින් සිරුරක් ඇත්තේ යුවතියක් නිසා ඇගේ සිරුර හොඳින් නිරාවරණය වන සේ සාමාන්‍ය සාරි ජැකට් එකක් නිර්මාණ කර ගෙන ඇත.

ඇගේ ආභරණ දුලක්ෂිගේ වගේම යොදාගෙන ඇත. මල් බුකිය කෘතිම ස්වරූපයක් ගනී.හිස් පලදෙනාව රෝස පැහැයෙන්ද පදක්කම් මාලද පැළඳ ඇත.

**ප්‍රාර්ථනා කොඩිකාර**



0772 63 52 63

# ලෝකයේ ප්‍රමිතිගතම ටයර්

# ශ්‍රී ලංකාවේ අඩුම මිලට

## ඔබේ ටයරය අපේ වගකීමයි.

සියලුම වර්ගයේ ජාත්‍යන්තර ප්‍රමිතිගත ටයර්
වගකීමෙන් ලබා ගන්න.

**එන්න අපේ වෙනස එක්ක අදම එකතුවෙන්න.**

- අලෙවියෙන් පසු සේවාව
- ප්‍රමිතිගත විශ්වාසය
- විශ්වාසනීය වගකීම
- සුහදශීලී සේවාව



STARWIN
TYRE HOUSE (Pvt) Ltd.

NO:555/2 ,KADUWELA ROAD, THALAHENA , BATTARAMULLA.